2006 මාර්තු
50 වසර 07 කලාපය

නවයුගය

50th Year 07th Issue
2006 March







# තේ වගාවේ හෙට දවස...

අපේ විදේශ විනිමය ආදායම් මාර්ග අතර තවමත් තේ සඳහා ප්‍රධාන තැනක් හිමි වී ඇත. තේ වගාව අපට හඳුන්වා දුන්නේ සුද්ද ය. තේ වගාව නිසා අපේ සමාජයේ ප්‍රබල ආර්ථික සමාජ පාරිසරික සහ දේශපාලන වෙනස්කම් රාශියක් සිදු විය.

සුද්ද ආරම්භ කළ තේ වගාව කඳුරට ප්‍රදේශයේ ව්‍යාප්ත වෙත් ම ඒවා සුද්දන්ට අයිති සමාගම් බවට පත් විය. මේ සමාගම් හරහා අපේ රටේ ධනස්කන්ධ විශාල ප්‍රමාණයක් පිටරට ට ඇදී ගියේ ය. 1972 වතු ජනසතු කිරීම සිදු කරනු ලැබුවේ ඒ ධනස්කන්ධය අප රට තුළ ඉතිරි කර ගැනීමේ පරම පවිත්‍ර චේතනාවෙන් ය. එහෙත් වතු ජනසතු කිරීමත් සමඟ රජයට අයත් වූ මහා පරිමාන තේ වගාව තුළට දේශපාලන හස්තය රිංගා ගැනීම නිසා වතු ජනසතුවේ අරමුණ ඒ ආකාරයෙන් ඉටු කර ගැනීමට හැකි නොවීය. ඒ නිසා ම ක්‍රමයෙන් තේ වතු පිරිහෙන්නට පටන් ගත්තේ ය. පාඩු ලබන්නට පටන් ගත්තේ ය.

මේ තත්ත්වයට පිළියම් වශයෙන් අසූව දශකයේ අග භාගයේ දී සහ අනූව දශකයේ මුල් භාගයේ දී තේ වතු යළි දේශීය සමාගම් වෙත පැවැරීම සිදු කෙරිණි. තේ වතු පමණක් නොව පොල් සහ රබර් වතු ද දේශීය සමාගම් වෙත පවරා දෙනු ලැබිණි. ඒ ක්‍රියා මාර්ගයේ ප්‍රකාශිත අරමුණ වූයේ ද මතු ලාභදායී ඒවා බවට පත් කිරීම ය. එහෙත් එමඟින් ද සිදු වූයේ වතු ජනසතු කිරීමෙන් සිදු වූ හානියටත් වඩා බරපතල හානියකි.

වතුවල පාලනය භාර ගත් දේශීය සමාගම් ඒවා සංවර්ධනය කර ලාභදායී තත්ත්වයට පත් කරනු වෙනුවට ඒවායේ සම්පත් විකුණාගෙන කෑමේ පිළිවෙතක් අනුගමනය කළේ ය. ප්‍රතිඵලය වී ඇත්තේ වතුවල තත්ත්වය වඩාත් නරක අතට හැරීම ය.

රජයේ පාලනය යටතේ පවතින ජනවසම යටතේ පවතින වතු පවා අදත් පවතින්නේ බොහෝ විට පාඩු ලබන මට්ටමක ය. වරින්වර පත් වන දේශපාලන අධිකාරීන් හිතුමතයට ගනු ලබන තීන්දු තීරණ නිසා ජනවසම තේ වතුවලට ඒ ඉරණම අත්වී තිබේ. කොටින් ම කියතොත් ජනවසම වතුවලට වසර තුන හතරකට වත්වක් හෝ පොහොර පවා නොලැබී යන තත්ත්වයක් මතු වී තිබේ.

ඒ නිසා රටට විශාල විදේශීය විනිමයක් ගෙන දෙන තේ වගාව, විශේෂයෙන් කඳුරට තේ වගාව රැක ගැනීමට නම් රාජ්‍ය මැදිහත්වීමකින් නව කළමනාකරණයක් ඇති කළ යුතු ය. එබඳු ඵලදායී කළමනාකරණයක් සහිත නව පාලන ව්‍යූහයක් සකස් නොකළ හොත් තේ වතු පාඩු ලබා විනාශ වී යනු පමණක් නොව අතිශය ප්‍රබල සමාජ ගැටලුවක් ද මතු වීමට හොඳට ම ඉඩ තිබේ. ඇත්ත වශයෙන් ම වනටමත් ඒ සමාජ ගැටලුවේ වැඩුණු අංකුර වතුකරයේ දකින්නට හැකි ය. ඒ රැකියා අහිමිවන ඉන්දියානු සම්භවයක් සහිත ශ්‍රී ලාංකීය ද්‍රවිඩ ජනයාගේ ගැටලුව වේ.

කඳුකරයේ තේ වගාව මෙවැනි අන්තරායකාරී තත්ත්වයකට පත්වී තිබුණ ද අපේ රටේ තේ තවමත් ලොව පුරා නම පවත්වා ගෙන යන්නේ පහත රට කුඩා තේ වතු හිමියන්ගේ අප්‍රතිහත ධෛර්යය නිසා ය. අද වන විට අපේ රටෙන් අපනයනය කරන තේවලින් වැඩි ප්‍රතිශතයක් අපනයන කරනු ලබන්නේ පහත රට කුඩා තේවතු වලින් ලැබෙන නිෂ්පාදනවලිනි. එමෙන් ම ලෝක වෙළෙඳ පොළේ හොද මිලක් ලැබෙන්නේද පහත රට කුඩා තේවතුවල තේවලට ය. මේ නිසා කුඩා තේ වතු කෙරෙහිද රජයේ දැඩි අවධානය යොමුවිය යුතු ය.

ඊට අමතරව තේ සම්බන්ධ නවත් ගැටලු රැසක් ඇත. අපේ හොඳ තේවලට වෙනත් රටවල බාල තේ මිශ්‍ර කොට ශ්‍රී ලංකා තේ ලෙස ලෝක වෙළෙඳපොළට නිකුත් කිරීම නිසා අපේ තේවල හොඳ නමට සිදු වන හානිය, තේ වෙන්දේසිය මිල නියම කිරීමේ ක්‍රමයෙන් බැහැර වී රජයේ මැදිහත්වීමකින් සෘජුව තේ අපනයනය සඳහා ක්‍රමවේදයක් සොයා ගැනීම, තේ වතුවල සංවර්ධනය සඳහා නව පර්යේෂණ සිදු කිරීම, ගිනිසීරියා වැනි අතුරු වගාවන් මගින් තේවතුවල ආදායම වර්ධනයකර ගැනීම, ඒවා අතර වේ.

මේ පිළිබඳ වහ වහා කටයුතු නොකළ හොත් අපට තේ අපනයනයෙන් ලැබෙන විදේශ විනිමය අහිමි වී යන්නට වැඩි කාලයක් ගත නොවනු ඇත.